# POLITICAL SCIENCE AND ITS SUB FIELDS (Part I)

# දේශපාලන දර්ශනය.

දේශපාලන දර්ශනවාදය ප්‍රධාන තේමා තුනක් පිළිබඳ ව අවධානය යොමු කරයි.

1. දේශපාලන විග්‍රහයේ භාවිත කරන සංකල්පවල අර්ථනිරූපණය පැහැදිලි කිරීම.
   a. උදාහරණ :-

      රාජ්‍යය, බලය, පුරවැසි භාවය, නිදහස, අයිතිවාසිකම් සමානත්වතාව .

Class Work LK

2. දේශපාලනය පිළිබඳ ඇති මූලික ප්‍රශ්න මතු කරමින් ඒවා ගවේෂණාය කිරීම.

උදාහරණ :-

රාජ්‍යය යනු කුමක් ද? රාජ්‍යයක් අවශ්‍ය වන්නේ ඇයි? රාජ්‍යයේ සම්භවය කෙසේ වී ද? දේශපාලනය යනු කුමක් ද?

3. දේශපාලන ක්‍රියාකාරීත්වය ,දේශපාලන ආයතන, රාජ්‍ය ප්‍රතිපත්ති යන මේවාට මඟ පෙන්වන ප්‍රතිමානීයක නිෂ්ඨාවන් යෝජනා කිරීම.

උදාහරණ :-

නිදහස, සමානාත්මතාව, සාධාරණත්වය, පොදු යහපත, සමාජ විමුක්තිය.

සම්භාව්‍ය ග්‍රීක යුගයේ සිට වර්තමානය තෙක් දේශපාලන දර්ශණවාදීන් උනන්දුවක් දක්වා ඇති තේමා කිහිපයක් ලෙස යුක්තිය, සාධාරණත්වය, අයිතිවාසිකම්, නිදහස, සමානාත්මතාව, දේශපාලන විමුක්තිය සහ රාජ්‍යයේ ස්වභාවය හා අරමුණු යන මේවා ඉදිරිපත් කළ හැකි ය.

ClassWork.LK

කෙසේ වෙතත් මෙම තේමා පිළිබඳ ව දේශපාලන දාර්ශනිකයන් අතර පොදු ඒකමතික භාවයක් නොමැති අතර, ඒවා සාකච්ඡාවට, විවාදයට සහ මතභේදයට ලක් වෙමින් හුදු සදාතන සංකල්පමය ප්‍රභේද වශයෙන් පවතී.

ClassWork.LK

දේශපාලන දර්ශනවාදීන් උනන්දුව දක්වා ඇති තේමා සහ ඒවා ගවේෂණය කළ දේශපාලන දාර්ශනිකයන් පිළිබඳ සරල අවබෝධයක් පහත වගුවෙන් ලබාගත හැකි ය.

| **තේමාව** | **සම්භාව්‍ය/මධ්‍යකාලීන සහ මුල් නූතන දේශපාලන දාර්ශනිකයෝ** | **සමකාලීන දේශපාලන දාර්ශනිකයෝ** |
|---|---|---|
| යුක්තිය/ සාධාරණත්වය | • ප්ලේටෝ, ඇරිස්ටෝටිල්,<br>• සාන්ත ඔගස්තීන්, සාන්ත ඇක්වයිනාස්,<br>• තෝමස් හොබ්ස්, ඩේවිඩ් හියුම්,<br>• ඉම්මානුවෙල් කාන්ට්, රූසෝ, ජෝන්<br>• ස්ටුවර්ට් මිල්,<br>• කාල් මාක්ස් | • ජෝන් රෝල්ස්<br>• රොබට් නොසික්<br>• මයිකල් සැන්ඩල්<br>• මාර්තා නස්බවුම්<br>• මහත්මා ගාන්ධි |
| සමානත්වය | • ඇරිස්ටෝටල් හොබ්ස්,<br>• ජෝන් ලොක්,<br>• රූසෝ ,<br>• මිල්,<br>• මාක්ස්, ඇලෙක්සි ද<br>• තොක්විල්,<br>• හර්බට් ස්පෙන්සර්,<br>• හියුගෝ ග්‍රෝෂියස්, ඉම්මානුවෙල්<br>• කාන්ට් | • මහත්මා ගාන්ධි<br>• මයිකල් වෝල්ට්සර්<br>• චාල්ස් ටේලර්,<br>• රොනල්ඩ් ඩ්වෝකින් |

ClassWork.LK

| | | |
|---|---|---|
| අයිතිවාසිකම් | • කාන්ට්, ද තොක්විල්,<br>• ලොක්, හියුම්<br>• ඇඩම් ස්මිත්<br>• මාක්ස්,<br>• මොන්ටෙස්කියු | • අයිසයා බර්ලින්, රොනල්ඩ්<br>• ඩ්වෝකින්,<br>• ජෝන් රෝල්ස්,<br>• චාල්ස් ටේලර් |
| නිදහස | • ප්ලේටෝ, ඇරිස්ටෝටල් හොබ්ස්,<br>• ලොක්,<br>• මාක්ස්,<br>• ජෙරමි බෙන්තම් | • අයිසයා බර්ලින්<br>• පෙඩ්‍රික් හයෙක්<br>• ජෝන් රෝල්ස්,<br>• ෆිලිප්<br>• පෙටිට් |
| දේශපාලනයේ ස්වභාවය | • ප්ලේටෝ<br>• ඇරිස්ටෝටල්<br>• ඔගස්තීන්<br>• මැකියාවෙල්ලි<br>• හොබ්ස්<br>• ලොක්<br>• රූසෝ<br>• කාන්ට්<br>• හේගල්<br>• මාක්ස් | • සී රයිට් මිල්ස්<br>• යර්ගන් හබර්මාස්<br>• චල්ස් ටේලර්<br>• මිෂෙල් ෆුකෝ |
| රාජ්‍යයේ ස්වභාවය | • මැකියාවෙල්ලි<br>• හොබ්ස්<br>• ලොක්<br>• මාක්ස් | • ජෝන් රෝල්ස්<br>• යර්ගන්<br>• හබර්මාස්<br>• චාල්ස් ටේලර් |

ClassWork.LK

19 වන සියවස දක්වා යුරෝපයේ දර්ශනවාදයට දේශපාලන විග්‍රහයේ ඉහළ ම ස්ථානයක් හිමි වුවද විසි වැනි සියවස මැද භාගයේ එය යම් පසුබෑමකට ලක් විය. එසේ වූයේ අනුභූතිවාදි/ප්‍රත්‍යක්ෂ මූලවාදී දේශපාලන විද්‍යා ප්‍රවේශය නැගීමේ පසුබිමෙහි ය.

එසේ වුවත් 1970 දශකයේ මුලදී යළිත් දේශපාලන විද්‍යාවේ දර්ශනවාදයට ඇති අවධානය ඉස්මතු වන්නට විය. එයින් දේශපාලන විද්‍යා විග්‍රහයේ නැති වු කීර්තිය සහ ස්ථානය යළිත් ලැබෙන්නට විය. එම වෙනස ඇතිවූයේ 1971 දී පළ වු ඇමරිකානු දේශපාලන දාර්ශනික ජෝන් රෝල්ස් ගේ *A Theory of Justice* (**යුක්තිය පිළිබඳ න්‍යායයක්**) නම් ග්‍රන්ථය හේතු කොට ගෙන යි.

ඒ සමඟ දාර්ශනිකයන්, දේශපාලන විද්‍යාඥයන් හා සමාජන්‍යායවේදීන් අතර ඇති වූ සාකච්ඡා හා විවාද දේශපාලන දර්ශනවාදය යළි ඔසවා තැබීමට පාදක විය.

Class Work.LK

ClassWork.LK